කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2017

දෙවන සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

# ECN 2214: බැංකු මූලධර්ම සහ භාවිතයන් (Principles and Practices of Banking)

කාලය- පැ දෙකයි (02)

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

ප්‍රශ්න අංක 01

(a) මූල්‍ය පද්ධතියක ප්‍රධාන කාර්යයන් පැහැදිලි කරන්න. ආර්ථික කළමනාකරණය සඳහා එකී කාර්යයන්ගේ වැදගත්කම තාර්කිකව විභාග කරන්න. (ලකුණු 9)

(b) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ ඔබ හඳුනා ගන්නා විවිධ මූල්‍ය ආයතන වර්ග පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 6)

ප්‍රශ්න අංක 02

(a) "වෙළඳපළ අපූර්ණතාවන් අවම කිරීම සඳහා මූල්‍ය අතරමැදි ආයතනයන්හි පැවැත්ම වැදගත් වේ." මෙම ප්‍රකාශනය තාර්කිකව පැහැදිලි කරන්න. (ලකුණු 8)

(b) මූල්‍ය අතරමැදිකරුවන් විවිධාකාර වූ මූල්‍ය පරිවර්තනයන් (transformation) සිදු කරනු ලැබේ. ඔබ ඉගෙන ගෙන ඇති ප්‍රධාන මූල්‍ය පරිවර්තන (transformation) ක්‍රම හතරක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 7)

ප්‍රශ්න අංක 03

(a) "මූල්‍ය අතරමැදිකරණය නොමැතිව ගනුදෙනු පිරිවැය අවම කර ගැනීම පහසු නැත". මෙම ප්‍රකාශනය පැහැදිලි කරන්න. (ලකුණු 8)

(b) මූල්‍ය අතරමැදි ආයතන ගනුදෙනු පිරිවැය පහත හෙළන්නේ කෙසේද? (ලකුණු 7)

ප්‍රශ්න අංක 04

(a) වාණිජ බැංකුවල ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 5)

(b) "බැංකු පද්ධතියේ සංචිත ඉහළ යාම වැඩිපුර තැන්පතු මැවීම සඳහා මග පෙන්වයි." ඔබගේ උදාහරණ ගෙන හැර දක්වමින් මෙම ප්‍රකාශනය තාර්කිකව පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ප්‍රශ්න අංක 05

(a) පසුගිය දශක කිහිපය තුළ වාණිජ බැංකු විසින් ඔවුන්ගේ ලාභ සහ පාරිභෝගික සේවා වර්ධනය සඳහා සැපයූ විවිධ වූ බැංකු නොවන සේවාවන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(b) "ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනවල බාහිර අරමුදල් ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය බැංකු ණය වේ". ඔබ එකග වේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

ප්‍රශ්න අංක 06

(a) චෙක්පතක් යන්න ඔබ නිර්වචනය කරන්නේ කෙසේද? (ලකුණු 03)

(b) රේඛනය නොකළ චෙක්පත් සහ රේඛනය කළ චෙක්පත් අතර වෙනස පැහැදිලි කරන්න.(ලකුණු 06)

(c) චෙක්පත් මගින් ගෙවීම් කිරීමේ වාසි කවරේද? (ලකුණු 09)

ප්‍රශ්න අංක 07

පහත ඒවායින් ඕනෑම තුනක් (3) පිලිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(a) මූල්‍ය ගනුදෙණු වලදී සිදු විය හැකි අයහපත් තේරීමේ ගැටලුව (Adverse Selection Problem in financial transactions)

(b) තැන්පතු භාර ගැනීමේ ආයතන

(c) බැංකු අධීක්ෂණය පිළිබද බාසල් කමිටුව

(d) අනේවාසික විදේශ මූල්‍ය ගිණුම් (NRFC)

(e) රැගෙන එන්නාට (Bearer) ගෙවීමට අණ කරන චෙක්පත්

(f) ඩිජිටල් බැංකුකරණය

(එකකට ලකුණු 5 බැගින්)